දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
Bachelor of Arts General (External) Degree Part II Reguler Examination 2015 – July/August 2018

සිංසා 3.2 - නූතන ප්‍රබන්ධකථා කලාව
# SLG 3.2 - Modern Fiction

කාලය පැය තුන යි

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය**

---

## පළමු කොටස

01. "අර්ථාන්විත අත්දැකීම් මූලාශ්‍රය කොට ගනිමින් මිනිස් ජීවිතය පිළිබඳ පරිඥානයක් පාඨකයා වෙත ලබා දීම නවකථාවකින් අපේක්ෂා කෙරේ." අභිමත නවකථාවක් ඇසුරු කොට ගෙන මේ අදහස පහදන්න.

02. ආගම හා සංස්කෘතිය අතර පවතින සම්බන්ධතාව මුල්කාලීන සිංහල ප්‍රබන්ධකථාකරුවන්ගේ නිර්මාණවල නිරූපණය වූ අයුරු නිදසුන් මගින් විචාරාත්මක ව පහදන්න.

03. විවාදාපන්න සමාජ කතිකාවක් නිර්මාණය කිරීමෙහි ලා පියදාස සිරිසේනයන්ගේ ප්‍රබන්ධ කථා උපස්ථම්භක වන අයුරු සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

04. පුවත්පත් කලාව, චිත්‍ර කලාව සහ කවිය සමග සසඳමින් කෙටිකථාවේ අනන්‍ය ලක්ෂණ පෙන්වා දෙන්න.

05. "කෙටිකථාවෙහි සංක්ෂිප්තභාවය නිසා ම ඊට බහුවිධතාවක් අත්පත් කර ගත හැකි වෙයි." සාධනය කරන්න.

## දෙ වන කොටස

06. <u>යුගාන්තයේ</u> නිරූපිත මාලින්ගේ චරිතයෙහි විද්‍යමාන වන "දේශපාලනික ලක්ෂණ" අද්‍යතන සමාජ දේශපාලන සන්දර්භය හා සසඳමින් ස්වාධීන විග්‍රහයක යෙදෙන්න.

07. <u>චරිත තුනක්</u> නවකථාවේ සංගෘහිත පුද්ගල ත්‍රිත්වයෙහි නිරූපිත මනෝ ක්‍රියාකාරකම් පිළිබඳ සංසන්දනාත්මක විවරණයක යෙදෙන්න.

08. " 'නෙලී මාච්' යනු සිය අවිඥානික ආශාව මගින් මෙහෙයවනු ලබන චරිතයකි." <u>ලෝමාලිකා</u> කෙටි නවකථාව ඇසුරින් විමසන්න.

09. " '<u>බල්ලා සමග සරන ලිය</u>' විවාහ සංස්ථාවේ අර්බුදය විදහා දක්වන කෙටිකතාවකි." සාකච්ඡා කරන්න.

********************************************